ඇමුණුම-01

**සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පරිපාලනය, මෙහෙයවීම හා අරමුදල් පාලනය පිළිබඳ උපදෙස්**

| අංකය | කාරණය | විස්තරය |
|---|---|---|
| 01. | මෙහෙයවීම හා පාලනය | සමෘද්ධි සුව බොජුන්හල/ අලෙවි මධ්‍යස්ථානය පිහිටි ඉඩම, ගොඩනැගිලි හා අනෙකුත් ජංගම නොවන වත්කම් රජය සතුවන අතර 2013 අංක 01 දරණ සමෘද්ධි පනත ප්‍රකාරව ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය සංවිධානය මගින් පහත උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.<br>1. සමෘද්ධි සුව බොජුන්හල හෝ අලෙවි මධ්‍යස්ථානය සඳහා සමෘද්ධි සුව බොජුන්හල හෝ අලෙවි මධ්‍යස්ථානය නමින් ආසන්නයේ පිහිටි සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ ගිණුමක් පවත්වාගෙන යාම හා නඩත්තු කිරිම. ගිණුම විවෘත කිරීම හා පවත්වාගෙන යාමේ බලය ප්‍රාදේශීය සංවිධානයේ සභාපති, අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුවේ එකඟතාවය මත පත්කළ ව්‍යාපාරික කණ්ඩායමේ එක් අයෙකු සහ ව්‍යාපෘති කළමනාකරුට පැවරේ.(ගිණුම මෙහෙයවීම සඳහා තිදෙනාගේම අත්සන් යොදාගත යුතුවේ. )<br>2.ප්‍රජා මූල අංශය මගින් ලබාදෙන උපදෙස් පරිදි පිළිගත් ක්‍රමයකට ගනුදෙනු සටහන් කිරිම.<br><br>3.ගිවිසුම්ගත ව්‍යාපාරික කණ්ඩායමෙන් දෛනික කුලිය අයකිරිම,රිසිට් පතක් නිකුත් කිරීම හා ගිණුම්ගත කිරිම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීම.<br><br>4.ආයතනය මගින් උපයන ආදායම ආයතනයේ දියුණුවට, නඩත්තුවට හා මෙහෙයුම් කටයුතු වලට යොදා ගැනීම.<br><br>5.අධික්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව මගින් අනුමත කරන ලද වියදම් දැරිම.<br><br>6.අධික්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුවේ අනුමැතිය පරිදි ඉදිකිරිම් කටයුතු, සංවර්ධන කටයුතු, අලුත්වැඩියා සහ මිලදිගැනිම් කටයුතු සිදුකිරිම.<br><br>7.ප්‍රධාන කරුණු අංක 08 යටතේ දක්වා ඇති පරිදි ව්‍යාපාරික කණ්ඩායම විසින් ආයතනයේ විදුලි ගාස්තු, ජල ගාස්තු, දුරකථන ගාස්තු ආදී මෙන්ම සුළු නඩත්තු වියදම් නිසි වේලාවට දරන බවට වග බලා ගැනිම.<br><br>8.ආයතනය තුල හා ඉන් පරිබාහිරව පවිත්‍රතා කටයුතු නිසිපරිදි සිදුවන බවට වගබලා ගැනිම.<br><br>9.ආයතනයේ සංවර්ධනය සඳහා වන යෝජනා අධික්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කිරිම. |
| 02. | අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව | සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථානයේ කටයුතු අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සඳහා පහත නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කළ යුතුය.<br>1.ප්‍රාදේශීය සංවිධානයේ සභාපති<br>2.සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු<br>3.ව්‍යාපෘති කළමණාකරු<br>4.අදාල වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී<br>5.අදාල කොට්ඨාශයේ සමෘද්ධි ව්‍යාපාරික සංගම් සභාපති<br>6.බොජුන්හල් ව්‍යවසායක කණ්ඩායම් ප්‍රධානී<br>මෙම කමිටුව මගින් අඛණ්ඩව පසුවිපරම් කටයුතු සිදුකළ යුතුවේ.<br><br>මෙම නිලධාරීන්ට අමතරව මාස 03 කට වරක් ප්‍රගති සමාලෝචනය පහත නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුකිරිම යෝග්‍ය වේ.<br>1.දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ<br>2.අදාල කොට්ඨාශයේ ප්‍රාදේශිය ලේකම්/ ප්‍රාදේශිය නිලධාරී<br>3.දිස්ත්‍රික් කාර්යාලයේ ජීවනෝපාය විෂය භාර කළමනාකරු හෝ අලෙවි විෂය භාර කළමනාකරු<br>ව්‍යාපෘති කළමනාකරුගේ මූලිකත්වයෙන් සෑම මසකට වරක් අදාල බොජුන්හල් සහ සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන වල අලෙවි කටයුතු සිදු කරන නිෂ්පාදක කණ්ඩායම් සමග ප්‍රගති සමාලෝචනය සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 03 | අධික්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුවේ කාර්යයන් | 1. බොජුන්හල පිළිබඳ අඛණ්ඩ පසුවිපරම<br>2. ගිණුම් කටයුතු පරික්ෂාව<br>3. ආයතනය සතු අරමුදල් ඇතුළු වත්කම් පාලනය සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරිමට ප්‍රාදේශිය ප්‍රජාමුල සංවිධානයට උපදෙස් ලබා දිම<br>4. බොජුන්හල මගින් මහජනතාවට අලෙවි කරන නිෂ්පාදිත පිළිබඳව තත්ත්ව පරික්ෂාව සඳහා අවශ්‍ය පියවර ගැනිම.<br>5. ආහාර නිෂ්පාදනයට, අලෙවියට හා අනෙකුත් සේවාවන් සඳහා අවශ්‍ය ව්‍යවසායකයින් හා සේවකයින් තෝරාගැනීම<br>6.නිෂ්පාදන වල මිල තීරණය කිරීම.<br>7.මාසික වාර්තා ලබාගෙන ව්‍යවසායකත්ව සංවර්ධන අංශය වෙත යොමු කිරීම.<br>8.දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ලද භාණ්ඩ සඳහා කුලියක් ගණනය කිරීම හා මෙම භාණ්ඩ වල වගකීම ව්‍යවසායකයින් වෙත ලිඛිතව බාරදීම.<br>9.මහජන සෞඛ්‍ය පරික්ෂක සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගැනීම<br>10.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෙල බොජුන්හල් සම්බන්ධයෙන් පුහුණුව ලත් නිලධාරීන්ගේ සහාය ලබාගැනීම<br>11. ආයතනයේ පැවැත්මට හා ඉදිරි කටයුතු සඳහා ව්‍යවසායකයින්ගේ දැනුවත්භාවය අනුව අවශ්‍ය සුදුසු තීරණ ගැනිම.<br>12.සමෘද්ධි සුවබොජුන් හා අලෙවි මධ්‍යස්ථානයන්හි අලෙවි කටයුතු සඳහා ව්‍යවසායකයින් හඳුනාගත් පසු ඔවුන් සමඟ අනිවාර්යයෙන් ගිවිසුම්ගත වීම අවශ්‍ය වේ. මෙහිදී මාස 12 ක් කාලයක් සඳහා ගිවිසුම්ගත වීම සිදුකළ යුතු අතර වර්ෂාවසානයේදී නැවත ගිවිසුම අළුත් කලයුතු වේ. |
| 04 | සමස්ථ අධීක්ෂණය හා පසු විපරම | ජාතික මට්ටමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අලෙවි සංවර්ධන අංශය මගින් සිදු කරන අතර සියළුම සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පොදු උපදෙස් නිකුත් කිරිම, පසු විපරම කිරිම හා ප්‍රගතිය ඇගයීම ද මෙම අංශය මගින් සිදු කරනු ඇත. දිස්ත්‍රික් මට්ටමේ සමස්ත අධීක්ෂණය හා පසුවිපරම් කටයුතුවල වගකීම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ වෙත පැවරීම. මෙම කටයුතු සඳහා ප්‍රධාන කරුණු අංක 02 හි 01-03 දක්වා නිලධාරීන්ගේ සහාය ලබාගෙන සිදුකිරීම. |
| 05 | ආයතන පරිශ්‍රයේ සිදු කළ හැකි ව්‍යාපාර කටයුතු | දෛනිකව සිදුකරනු ලබන ආහාර නිෂ්පාදනය සහ අලෙවි කටයුතු වලට අමතරව සුව බොජුන්හලෙහි පවතින ඉඩ පහසුකම් අනුව රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හී අවශ්‍යතා වෙනුවෙන් උත්සව,සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් සඳහා ලබා දීමට ප්‍රාදේශිය සංවිධානය වෙත බලය පවරා දෙනු ලබන අතර මේ සඳහා සුදුසු පරිදි ගාස්තු අය කිරීම හා වෙළඳපොළ උච්චාවචනයන්ට අනුකූල වන පරිදි මිල ගණන් තීරණය කිරීම අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචන කමිටුව වෙත පැවරෙන අතර මේ සම්බන්ධයෙන් ව්‍යවසාය සංවර්ධන අංශය දැනුවත් කිරීම අවශ්‍ය වනු ඇත.<br>රටේ පවතින ආර්ථික තත්ත්වය, ප්‍රදේශයේ පාරිභෝගික අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දිවා හා රාත්‍රි ආහාරය සඳහා බත්, ප්‍රදේශයෙන් සපයාගත හැකි එලවළු හා මාළු/මස් යොදාගෙන පිළියෙල කරගත් ආහාර අලෙවි කළ හැක.විශේෂ උත්සව වැනි අවස්ථාවලදී සිදු කරනු ලබන ව්‍යාපාරික කටයුතු වලදීද මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම. |

| | | |
|---|---|---|
| 06 | ව්‍යාපාර කටයුතු සිදුකරන වේලාවන් | නිෂ්පාදන අලෙවි කිරිම සඳහා පෙ:ව: 7.00 - ප:ව:1.00 හා ප:ව: 1.00 - ප:ව: 7.00 දක්වා වන ලෙස මුර දෙකකට අවස්ථාව සලසා දිය හැකි අතර, අනෙකුත් ව්‍යාපාර කටයුතු පෙ:ව: 7.00 - ප:ව:7.00 දක්වා සිදු කළ හැකිය. එහෙත් අවශ්‍යතාවය මත කාලය සංශෝධනය කරගත හැකි බැවින් අවශ්‍යතාවය හා ඉල්ලුම අනුව ව්‍යාපාර කටයුතු සිදුකරන වේලාවන් ප්‍රාදේශීය අවශ්‍යතාවය මත සංශෝධනය කර ගැනිම අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව සතුය. |
| 07 | ව්‍යාපාරිකයින්ගෙන් කුලිය අය කිරිම | සමෘද්ධි සුව බොජුන්හලෙහි ආහාර නිෂ්පාදනය කරනු ලබන එක් ව්‍යාපාරික කාන්තාවකගෙන් හා අලෙවි කුටිවල වෙළඳාම් සිදු කරනු ලබන එක් ව්‍යාපාරිකයෙකුගෙන් අවම වශයෙන් රු: 200.00 ක දෛනික මුදලක් අය කළ යුතුය.එහෙත් දෛනිකව ලැබෙන ආදායමට සමානුපාතිකව අයකරනු ලබන මුදල අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචන කමිටුව මගින් තීරණය කිරිම. |
| 08 | වියදම් | • බොජුන්හල හා අලෙවි මධ්‍යස්ථානයේ විදුලි ගාස්තු, ජල ගාස්තු වියදම් ව්‍යාපාරික කණ්ඩායම විසින් දැරීය යුතුය<br>• මසකට රු.5000.00 නොඉක්මවන වෙනත් සුළු වියදම් වේ නම් වියදම් ව්‍යාපාරික කණ්ඩායම විසින් දැරීය යුතුය<br>• ඉහතින් දැක්වූ වියදම් හැර වෙනත් ප්‍රාග්ධන හෝ නඩත්තු වියදම් වේ නම් අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුවේ තීරණයෙන් ප්‍රාදේශීය සංවිධානයේ එකඟතාවය මත නැවත ප්‍රතිපූර්ණය කිරිමේ පදනමින් ප්‍රාදේශීය සංවිධානයේ අරමුදලින් දැරිය හැක. |
| 09 | ගිණුම් ක්‍රියාවලිය | සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන හා සමෘද්ධි සුව බොජුන්හල් ව්‍යාපෘතිය ප්‍රජා මූල සංවිධානයේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන බැවින් අදාල ගිණුම් යෙදීම ප්‍රාදේශීය සංවිධානයෙන් සිදු කල යුතුය. |
| 10 | ආරක්ෂක කටයුතු හා සනීපාරක්ෂක කටයුතු | ආරක්ෂක කටයුතු වෙනුවෙන් සමෘද්ධි සුව බොජුන්හල් හා සමෘද්ධි අලෙවි මධ්‍යස්ථානයන් සඳහා මුරකරුවෙකු අවශ්‍ය වේ නම් අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව මගින් තීරණයක් ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරිම.මෙහිදී ව්‍යාපාරික කණ්ඩායම විසින් ගෙවනු ලබන දෛනික ගාස්තු වලට අමතරව මෙම වියදම් දැරිය යුතු අතර සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ කටයුතු සඳහාද මෙම ක්‍රමවේදයම අනුගමනය කිරිම. |
| 11. | තැන්පතු ගාස්තු අයකිරිම | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත ලබාදෙනු ලබන භාණ්ඩ හා උපකරණ ව්‍යාපාරික ප්‍රජාව විසින් භාවිතා කිරිම වෙනුවෙන් අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුවේ එකඟතාවය මත ගාස්තුවක් අයකිරිම සිදු කළ යුතුය. |
| 12. | පුහුණුව | ව්‍යවසායික කාන්තාවන් සඳහා අවශ්‍ය ආහාර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුව ලබාගත හැකි රජයේ ආයතනයක් මගින් අනිවාර්යයෙන් ලබාදිමට කටයුතු කිරිම. |